# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2143/17 - 2019 ඔක්තෝබර් මස 02 වැනි බදාදා - 2019.10.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත**

14 වැනි වගන්තිය යටතේ නියෝගය

සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍ය මලික් සමරවික්‍රම වන මම, මුදල් අමාත්‍යවරයාගේ ද එකඟතාවය ඇතිව 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 14 (2) වගන්තිය මගින් මා වෙත පවරා ඇති බලතල ප්‍රකාරව, මෙම නියෝගය 2019 මාර්තු 05 දිනැති අංක 2113/4 දරන *අති විශෙෂ ගැසට්* නිවේදනය මගින් සංශෝධිත කරන ලද 2017 නොවැම්බර් 27 දිනැති අංක 2047/2 දරන *අති විශෙෂ ගැසට්* නිවේදනයේ 2 වන ඡේදයේ (xiv) වන උප ඡේදයට වහාම පහතින්, පහත සඳහන් උප ඡේද එකතු කිරීමෙන්, සංශෝධනය කරමි.

''(xv) 2005 අංක 38 දරන සංචාරක පනත යටතේ පිහිටුවනු ලද ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි කර ඇති හා 1978 අංක 4 දරන ආයෝජන මණ්ඩල නීතිය යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමග ගිවිසුමකට එළඹ තිබෙන ඕනෑම සංචාරක ව්‍යවසායයක් විසින් ආනයනය කරන ලද සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ 94.03 යටතේ වර්ගීකරණය කරන ලද ඕනෑම ගෘහ භාණ්ඩයක්.

(xvi) 2019 මාර්තු 06 හෝ එදිනට පසුව ව්‍යාපෘතියක ඇ. ඩොලර් මිලියන 50 හෝ ඊට වැඩි ආයෝජනයක් සිදුකරන ඕනෑම ව්‍යවසායයක් මගින්, එකී ව්‍යාපෘතිය ආරම්භ කරන තෙක් හෝ ව්‍යාපෘතිය ඉදිකිරීම් සිදු කරන කාලසීමාව තුළ නමුත් වාණිජ ක්‍රියාකාරකම් ආරම්භ කිරීමට පෙර, ආනයනය කරනු ලබන ඕනෑම භාණ්ඩයක්.

(xvii) දේශගුණික තත්ත්වයන් පාලනය කෙරෙන ගබඩා පහසුකම්/ශීත දාම සැපයුම් යටිතල පහසුකම් ස්ථාපිත කිරීමේ ව්‍යාපෘති සඳහා ආයෝජනය කරනු ලබන ඕනෑම ව්‍යවසායයක් මගින්, ව්‍යාපෘතිය ආරම්භ කරන තෙක් හෝ ඉදිකිරීම් සිදු කරන කාලසීමාව තුළ නමුත් වාණිජ ක්‍රියාකාරකම් ආරම්භ කිරීමට පෙර ආනයනය කරනු ලබන, ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තු විෂය පථය අයත් වන අමාත්‍යාංශ ලේකම් ගේ නිර්දේශයට අනුව මුදල් අමාත්‍යාංශයේ ලේකම් විසින් භාණ්ඩ ලැයිස්තු අනුමත කිරීමට යටත්ව සංයෝජිත වර්ගීකරණ කේත යටතේ (*අනු අංක 8 දක්වා වන ජාතික උප ශීර්ෂ*) වර්ගීකරණය කරන ලද ඕනෑම භාණ්ඩයක්.

මෙම උප ඡේදයේ විධිවිධාන මෙම නියෝගය පළ කිරීමෙන් වසර 3 ක් දක්වා වලංගු වේ.''

මෙම නියෝගය ඔක්තෝබර් මස 03 වැනි දින සිට ක්‍රියාත්මක වේ.

මලික් සමරවික්‍රම,
සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍ය.

2019 ඔක්තෝබර් මස 02 වැනි දින,
කොළඹ 01,
සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශයේ දී ය.

10 - 633


1A - PG 4672 — 567 (2019/10) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*